සැ. යු. - 2016.08.05 දින පළ වූ අංක 1979 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,980 - 2016 අගෝස්තු මස 12 වැනි සිකුරාදා - 2016.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1378 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සැ. යු.-** මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත 2016 මැයි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 සැප්තැම්බර් මස 02 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අගෝස්තු මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජූනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් පාලන නිවේදන

## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

වාර වාර්තා ලබා ගැනීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන කේ. ජී. සී. රත්නායක වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) සමඟ කියවිය යුතු එම පනතේ 139 වගන්තිය ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු සිදුකිරීමේ සහ සේවා සැපයීමේ කාර්යය පහසුකර ගැනීම සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ඇති සියලුම දේපළ පිළිබඳ තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 04 වැනි දින තීරණ අංක 14 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

### තීරණය

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ.ජී.සී. රත්නායක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 139 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වරිපනම් බදු පැනවීමට යටත් යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට සහ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගා කළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීමට එම ගෙයි ගොඩනැගිල්ලේ ඉඩමේ හෝ ගෙපතේ අයිතිකරුවන්ගේ වාර වාර්තා ලබා ගැනීමටත් එකී වාර වාර්තා සභාව මගින් නියම කරනු ලබන දිනයේ දී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ලබාදෙන ආකෘතිය පුරවා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙනවිත් භාරදෙන ලෙස එම දේපළ හිමිකරුවන් වෙත විධානය කිරීම සුදුසු බවටත් මම තීරණය කරමි.

කේ. ජී. සී. රත්නායක,
ලේකම්,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2016 ජූලි මස 18 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

08 - 333

---

## තවලම ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ තවලම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.05.18 වැනි දින තීරණ අංක 122 යටතේ පහත දක්වා ඇති තීරණය මා විසින් ගනු ලැබූ බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව 2016.06.01 වැනි දින සිට පිළිගෙන වැළඳගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්.ජී.කේ. චන්දන,
ලේකම්,
තවලම ප්‍රාදේශීය සභාව.

2016 මැයි මස 30 වැනි දින
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### තීරණය

දකුණු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සකස් කරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව 2013.10.25 වැනි දිනැති අංක 1834 *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළාත් සභා යටතේ පළකරන ලද අතර, එම කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවේ 2014.08.12 වැනි දින දකුණු පළාත් සභාව සම්මත කොට ඇත. පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 (3) වගන්තිය හා 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධි විධාන) පනතේ 2 වන වගන්තිය අනුව පළාත් සභාව එසේ ස්ථිර කරන ලද බව 2014.10.17 වැනි දිනැති අංක 1884/61 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv(අ) වැනි කොටසේ ප්‍රාදේශීය සභාවන්ට අදාළව පළකර ඇති ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභාවන්ට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.06.01 වැනි දින සිට පිළිගෙන වැළඳ ගෙන ක්‍රියාත්මක කිරීමට තවලම ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩබ්.ජී.කේ. චන්දන වන මා විසින් තීරණය කරමි.

08 - 330

---

## දෙවිනුවර ප්‍රාදේශීය සභාව

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙවිනුවර ග්‍රාමයේ, පතරම්බ වත්තේහි පිහිටි දෙවිනුවර පොදු සුසාන භූමිය හා ආදාහනාගාරය දෙවිනුවර ප්‍රාදේශීය සභාවට අයත් දෙවිනුවර පොදු සුසාන භූමිය හා ආදහනාගාරය ලෙස *ගැසට්* කිරීමට තීරණ පොතේ තීරණ අංක 77 ලෙස තීරණය කරන ලදී.

දෙවිනුවර පොදු සුසාන භූමිය හා ආදාහනාගාරයේ සීමාවන්:

- ප්‍රමාණය හෙක්ටයාර් 0.5411 (අක්.01 රූඩ්.01 පර්චස්.14)
- දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර ග්‍රාමයේ පිහිටි පතරම්ඹ වත්ත නැමති දෙවිනුවර පොදු සුසාන භූමිය හා ආදාහනාගාරය ඉඩම පොකුණු කණ්ඩිය වත්ත, වරිපනම් අංක 62/12 දක්වා මුදියන්සෙගෙවත්ත සහ උස්වත්ත, වරිපනම් අංක 66/1 පතරම්ඹ වත්ත සහ ධීවර වරාය මාර්ගයන් සීමාවන් වේ.

S.W.A. කරුණාසිරි,
ලේකම්,
දෙවිනුවර ප්‍රාදේශීය සභාව.

08 - 315

---

## තවලම ප්‍රාදේශීය සභාව

### වරිපනම් බදු පැනවීම හා අක්කර බද්දේ කාර්ය සඳහා අවශ්‍ය වාර වාර්තා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් තවලම ප්‍රාදේශීය සභා ලේකම්වරයා වශයෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.05.10 වැනි දින තීරණ අංක 95 යටතේ පහත දක්වා ඇති තීරණය මා විසින් ගනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. කේ. චන්දන
ලේකම්,
තවලම ප්‍රාදේශීය සභාව.

2016 මැයි මස 31 වැනි දින
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139(1) උප වගන්තිය පරිදි ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව වරිපනම් බදු පැනවීම හෝ අක්කර බද්දේ කාර්යය සඳහා අවශ්‍ය යැයි සැළකිය හැකි තොරතුරු ලබාගැනීමට යම් ඉඩමක, ගෙයක, ගොඩනැගිල්ලක හෝ ගෙපතක අයිතිකරුට සහ පදිංචිකරුට වාර වාර්තා සපයන ලෙස තවලම ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ඩබ්. ඒ. කේ. චන්දන වන මා විසින් තීරණය කරමි.

08 - 332

---

## තවලම ප්‍රාදේශීය සභාව

### අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ තවලම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.06.02 වැනි දින තීරණ අංක 143 යටතේ පහත දක්වා ඇති තීරණය මා විසින් ගනු ලැබූ බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව මෙහි උපලේඛනයේ සඳහන් පොදු සම්මත අතුරු ව්‍යවස්ථා සියල්ල ගැසට් නිවේදනයේ පළවන දින පටන් තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක විය යුතු බව තීරණය කළ බවත්, වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්.ඒ.කේ. චන්දන,
ලේකම්,
තවලම ප්‍රාදේශීය සභාව.

2016 ජූනි මස 20 වැනි දින
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

### තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනත හා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පළාත් සභාවේ පළාත් විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් සාදනු ලැබ 2013 මැයි මස 17 වන සිකුරාදා දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ පල කරන ලද්දා වූ දකුණු පළාත් සභාව විසින් අනුමත කර 2014.08.29 වැනි දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ පළ කරන ලද්ද වූ අතුරු ව්‍යවස්ථා අතුරින් පහත උපලේඛනයේ දක්වන්නා වූ අතුරු ව්‍යවස්ථාවන් තවලම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන වැළඳගැනීමටත්, එකී අතුරු ව්‍යවස්ථාවන් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කර ප්‍රසිද්ධ කරන දින සිට තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක විය යුතු බවටත්, තවලම ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩබ්.ඒ.කේ. චන්දන වන මා විසින් තීරණය කරමි.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| I. | කොටස | - | සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළ අර්ථ නිරූපණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| II. | කොටස | - | සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලටම අදාළ පොදු විධිවිධාන අතුරු ව්‍යවස්ථා |
| III. | කොටස | - | කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| IX. | කොටස | - | කිරිපට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| X. | කොටස | - | පිහිණුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XVI. | කොටස | - | කර්මාන්තශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XVII. | කොටස | - | අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳව අතුරු ව්‍යවස්ථා |
| XIX. | කොටස | - | පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා |

| | | | |
|---|---|---|---|
| XX. | කොටස | - | ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XXII. | කොටස | - | මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXIII. | කොටස | - | ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XXIV. | කොටස | - | ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා |

08 - 331

---

**ඝන අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

යටිනුවර ප්‍රාදේශීය සභාව

නිවේදනය

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (3) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2016 ජූලි මස 22 වැනි දින,

තීරණ අංකයः
දිනයः

***තීරණය***

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (02) වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ඝන අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (3) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමි.

08-241

**දෙවිනුවර ප්‍රාදේශීය සභාව**

දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම

දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛන අංක 01 හි දක්වා ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත ප්‍රදේශය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාර දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා 2016.10.08 වැනි දිනැති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශය අනුව 2015.10.08 වැනි දින තීරණ පොතේ පිටු අංක 40 හි සඳහන් අංක 3.12 තීරණය පරිදි උප ලේඛන 01 හි සඳහන් ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශ බවට පළාත් පාලන කොමසාරිස් විසින් අනුමත කර ඇති බවත් ඒ අනුව උප ලේඛනය මඟින් දක්වා ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත ප්‍රදේශ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය අනුව මහජනතාව වෙත නිවේදනය කරනු ලැබේ.

එස්. ඩබ්. ඒ. කරුණාසිරි,
ලේකම්,
දෙවිනුවර ප්‍රාදේශීය සභාව.

2016 ජූලි මස 20 වැනි දින.

**උපලේඛනය අංක 01**

| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසවල නම්* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසවල අංක* |
|---|---|---|
| 1. | දෙවිනුවර උතුර | 432 |
| 2. | දෙවිනුවර මධ්‍යම | 432 A |
| 3. | වාව්ව | 433 E |
| 4. | කපුගම බටහිර | 435 |
| 5. | ගන්දරාවත්ත දකුණ | 435 A |
| 6. | කපුගම නැගෙනහිර | 436 |
| 7. | කපුගම උතුර | 436 B |
| 8. | කපුගම මධ්‍යම | 436 C |
| 9. | ගන්දර බටහිර | 437 |
| 10. | ගන්දර නැගෙනහිර | 437 A |
| 11. | ගන්දර දකුණ | 437 B |
| 12. | ගන්දර මධ්‍යම | 437 C |
| 13. | තලල්ල දකුණ | 438 |
| 14. | තලල්ල මධ්‍යම | 438 A |
| 15. | තලල්ල | 438 C |
| 16. | නාඹටුන්න දකුණ | 442 B |

08 - 314

## දෙව්නුවර ප්‍රාදේශීය සභාව

දෙව්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(3) වගන්තියෙන් සහ 261 වන අධිකාරය 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (i) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා ලේකම් එස්. ඩබ්. ඒ. කරුණාසිරි වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙව්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපති සුජීව වෙදගේ යන අය විසින් පළ කරනු ලදුව අංක 1912 හා 2015.04.24 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කර පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථා 2016 මාර්තු මස 10 වැනි දින මුදල් හා ප්‍රතිපත්ති කමිටු තීරණ අංක 3,4 හා තීරණ පොතේ තීරණ අංක 78 යටතේ අවලංගු කළ බව නිවේදනය කරමි.

එස්. ඩබ්ලිව්. ඒ. කරුණාසිරි,
ලේකම්,
දෙව්නුවර ප්‍රාදේශීය සභාව.

08-313/1

---

## දෙව්නුවර ප්‍රාදේශීය සභාව

261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(3) වගන්තියෙන් දෙව්නුවර ප්‍රදේශීය සභාවේ ලේකම් එස්.ඩබ්.ඒ. කරුණාසිරි වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2016 මාර්තු මස 10 වැනි දින පහත උප ලේඛනයෙහි සඳහන් මුදල් හා ප්‍රතිපත්ති කමිටු තීරණ අංක 3.5 හා තීරණ අංක 78 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්.ඩබ්.ඒ. කරුණාසිරි,
ලේකම්,
දෙව්නුවර ප්‍රාදේශීය සභාව.

2016 මාර්තු මස 10 වැනි දින,
දෙව්නුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය I

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 දරන වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට ලබාදී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තියෙන් පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල පරිදි එකී පළාත් පාලන විෂය ඇති අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව අංක 520/7 හා 1988.08.23 දින දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරවන ලද්දා වූ ද 1989 අංක 12 දරන පළාත් පාලන (ආනුශාංගික විධිවිධාන) පනතේ 02 (iii) වගන්තිය අනුව දකුණු පළාතේ පළාත් සභාව විසින් පිළිගත් බවට අංක 648 හා 1991.02.23 දින දරන *ගැසට් පත්‍රයේ* පළමු නිවේදනයේ ප්‍රකාශිත වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල 7,9,10,12,13,17,18,24,25,26,29,30,31,32,33,34,35,36,37,39,41,42 යන අතුරු ව්‍යවස්ථා ඒ ආකාරයෙන් පිළිගැනීමටත් අංක 21 "අප්‍රසන්න හා අන්තරායදායක වෙළෙඳාම" අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයෙහි සඳහන් පහත උපලේඛන ii හි සඳහන් වෙළෙඳාම් ඇතුළත් කර ගැනීමට හා 2013.05.17 දින අංක 1811 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ ප්‍රකාශයට පත්කරන ලද්දා වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල අංක ix,xxiv,xxvii හැර අංක i සිට xxix දක්වා වූ අනෙකුත් අතුරු ව්‍යවස්ථා දෙව්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(3) වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව මුදල් හා ප්‍රතිපත්ති කමිටු තීරණ අංක 3.5 හා තීරණ පොතේ තීරණ අංක 78 යටතේ දෙව්නුවර ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එහි ලේකම් වන එස්.ඩබ්.ඒ. කරුණාසිරි වන මා විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

### උපලේඛනය

*අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර*

1. මාළු විකිණීම් ස්ථානයක් පවත්වාගෙන යාම.
2. මස් විකිණීම.
3. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
4. කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු, සැලුන් හල් හා රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
5. බේකරියක් පවත්වාගෙන යාම.
6. කිරි පට්ටියක් පවත්වාගෙන යාම.
7. පිහිනුම් තටාකයක් පවත්වාගෙන යාම.
8. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
9. බත් කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම.
10. හෝටලයක් පවත්වාගෙන යාම.
11. නවාතැන් පොළක් පවත්වාගෙන යාම.
12. ලොන්ඩරියක් පවත්වාගෙන යාම.
13. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
14. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම.
15. සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
16. ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථානයක් පවත්වාගෙන යාම.

17. යන්ත්‍රානුසාරයෙන් කළුගල් කැඩීමේ මෝලක් පවත්වාගෙන යාම.
18. පොහොර නිෂ්පාදනය.
19. පොහොර ගබඩාකර තැබීම.
20. උම්බලකඩ හොන්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
21. කුකුළු වෙළඳපොළක් පවත්වාගෙන යාම.
22. කළුගල් කැඩීම හා කබොක් කැපීම.
23. අශ්වයින් හෝ ගවයන් සඳහා ඉස්තාලයක් වෙළෙඳපලක් ගාලක් හෝ ලැයිමක් තබාගැනීම.
24. පශු ගිලන්හලක් පවත්වාගෙන යාම.
25. රබර් සකස් කිරීම.
26. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබුණ ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම, අළුත්වැඩියා කිරීම හෝ ඒවායේ දූලි ඉවත් කිරීම.
27. කළුගල් පිපිරවීම සඳහා ස්ථර ගැසීම හෝ ගල් වලක් පවත්වාගෙන යාම.
28. බැටළුවන්, එළුවන් දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල් කොට තැබීම සඳහා මඩුවක් හෝ ගාලක් තබා ගැනීම.
29. උළු, කොන්ක්‍රීට්, පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
30. හුණු ගබඩා කොට තැබීම.
31. බොම්බයි එළුණු හොන්ඩර 5 කට වඩා ගබඩා කොට තැබීම.
32. අර්තාපල් එළුණු හොන්ඩර 5 කට වඩා ගබඩා කොට තැබීම.
33. පොල්කටු අඟුරු හොන්ඩරයකට වඩා ගබඩා කොට තැබීම.
34. පරණ ලෝහ ගබඩා කිරීම.
35. සිමෙන්ති හොන්ඩර 25කට වඩා ගබඩාකර තැබීම.
36. කරවල හොන්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
37. ලුණු දැමූ මාළු හොන්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
38. මරා සකස් කළ කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වා ගෙන යාම.
39. ගම් වර්ග නිෂ්පාදනය.
40. බැටරි පුරවනු ලබන්නා වූ බැටරි ගබඩා කොට තබනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම.
41. ටයර් ප්‍රතිසංස්කරණය කරන්නා වූ හෝ කට්ට කැපීම කරනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම.
42. ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
43. මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ මිනී පෙට්ටි සෑදීම හා ගබඩා කොට තැබීම.
44. ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ ගෘහ භාණ්ඩ සෑදීම සහ ගබඩා කොට තැබීම.
45. වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ වේවැල් බඩු සෑදීම සහ ගබඩා කොට තැබීම.
46. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම.
47. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
48. පිටි හෝ කුළු බඩු ඇඹරීම.
49. පුන්නක්කු හැර සත්ත්ව ආහාර හොන්ඩර 20කට වඩා ගබඩාකර තැබීම.
50. සත්ත්වාහාර සඳහා හැර වෙනත් කාර්යයන් සඳහා ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම, එහෙත් සමුපකාර සමිතියක් විසින් ගබඩා කොට තබා ගන්නා එවැනි ධාන්‍ය මෙම නියමයට යටත් නොවේ.
51. රබර් නිෂ්පාදන භාණ්ඩ.
52. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම.
53. පොලිතීන්, සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය සහ ගබඩා කර තැබීම.
54. ඇසිඩ් ගැළුම් 05කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
55. බූට් සපත්තු සහ පාවහන් නිෂ්පාදනය.
56. ඉටිපන්දම් නිෂ්පාදනය.
57. වාෂ්ප, ජලය හෝ වෙනත් විදුලි යාන්ත්‍රික බලයලත් යොදාගෙන දැවවලින් හෝ ලී ඉරීම.
58. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම.
59. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය.
60. යන්ත්‍රානුසාරයෙන් තෙල් වර්ග නිෂ්පාදනය.
61. තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත්මෝලක් තබා ගැනීම.
62. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කොට තැබීම හෝ කෙඳි නිෂ්පාදනය සහ ගබඩා කොට තැබීම.
63. ගිනි පෙට්ටි නිෂ්පාදනය.
64. යාන්ත්‍රි කොහු මෝලක් පවත්වාගෙන යාම.
65. පොල්තෙල් ගැළුම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
66. උළු 500කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
67. ගඩොල් 250කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
68. කබොක් 250කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
69. යාන්ත්‍රික වඩු කර්මාන්තය පවත්වාගෙන යාම.
70. බීඩි නිෂ්පාදනය.
71. තීන්ත හෝ වාර්නිෂ් හොන්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
72. ලී පෙට්ටි හොන්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
73. කොහු නිෂ්පාදනය.
74. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබුණු ගෝනි හැර වෙනත් ගෝනි 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.

75. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
76. රස කැවිලි නිෂ්පාදනය.
77. පොල් කටු අඟුරු හොන්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
78. බෝට්ටු හෝ පත්තල් සෑදීම.
79. ඔක්සිජන් සහ වෑල්ඩිං වැඩ කරනු ලබන්නා වූ ද මෝටර් වාහන අළුත්වැඩියා කරන්නාවූ ද ගරාජයක් නොවන්නාවූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
80. මෝටර් වාහන අළුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම.
81. යාන්ත්‍රික බලය යොදාගනු ලබන්නාවූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
82. අතින් හෝ පාපොලුවලින් ක්‍රියාකරවන යාන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
83. පොල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගනෙ යාම.
84. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය.
85. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ/හෝ ගබඩා කර තැබීම.
86. අළුත් ටයර් හෝ ටියුබ් 150 කට අධික ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
87. පාවිච්චි කළ කඩදාසි කිලෝ ග්‍රෑම් 250 කට අධික ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
88. ස්ප්‍රේ පේන්ට්ං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
89. යාන්ත්‍රික ශීතකරණ සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
90. යාන්ත්‍රි බලය පාවිච්චි කරනු ලබන්නාවූ ද ඇඳුම් මැසීම කරනු ලබන්නාවූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
91. කමිස කොලර් සහ කමිස අත් රැලි දමන ස්ථානයක් පවත්වාගෙන යාම.
92. ඩ්‍රයි ක්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම.
93. යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම.
94. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නාවූ ද ඉලෙක්ට්‍රෝ පේන්ට්ං වැඩ කරනු ලබන්නාවූ ද ගරාජයක් නොවන්නාවූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
95. අශුද්ධ ලෝහ උණු කිරීම.
96. ගිණි කෙළි භාණ්ඩ ගබඩා කිරීම.
97. කිලෝ ග්‍රෑම් 02කට අධික ප්‍රමාණයක් වෙඩි බෙහෙත් සහ පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීම.
98. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය.
99. ශීතකරණ අළුත්වැඩියා කිරීම, රීකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
100. මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
101. ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
102. පුපුරණ ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
103. වී මෝලක් පවත්වාගෙන යාම.
104. ලී මෝලක් පවත්වාගෙන යාම.

08-313/2

---

## දෙවිනුවර ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් සහ එකී පනතේ 9 වැනි වගන්තියේ 3 වන උපවගන්තියෙන් දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්.ඩබ්ලිව්. ඒ. කරුණාසිරි වන මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාර, දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ප්‍රදර්ශනය කරනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් දැන්වීම් පුවරු/ බැනරයක් වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ පරිදි වාර්ෂික බද්දක් 2016 වර්ෂය සඳහා අය කිරීමට 2016.03.10 දිනැති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව අංක 3.5 සහ තීරණ පොත් අංක 78 යටතේ තීරණය කරන ලදී.

එස්. ඩබ්ලිව්. ඒ. කරුණාසිරි,
ලේකම්,
දෙවිනුවර ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| 1. ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට (01 කට) | රු. 75.00 |
| 2. බැනරයක් සඳහා වර්ග අඩියකට | රු. 25.00 |

08-313/3

## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

### වරිපනම් බදු ගෙවීම් පැහැර හැරීම සහ වරෙන්තු ගාස්තු නොගෙවන ලද දේපළ තහනම් කර විකිණීම

පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දේපළ වෙනුවෙන් අයවිය යුතු හිඟ වරිපනම් බදු හා වරෙන්තු ගාස්තු අයකර ගැනීමට තහනම් කිරීම සඳහා වංචල දේපළ නොමැති කල්හි මහා නගර සභා ආඥපනතේ (252 අධිකාරය) 252 වැනි වගන්තිය ප්‍රකාර, දෙහිවල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය පිට තහනම් කරන ලද දේපළ වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු සහ වරෙන්තු ගාස්තු යථා කාලයේ දී ගෙවනු නොලැබුවහොත් එකී දේපළ එකී උපලේඛනයේ සඳහන් දිනයක් හා වේලාවන්හි දී මහා නගර සභා ආඥාපනතේ 256 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

*සැලකිය යුතුයි :-*

01. ඉහත සඳහන් දේපළ සම්බන්ධයෙන් අයවීමට ඇති හිඟ මුදල් ගෙවීමට පෙර එම කාර්යාලයට පැමිණ ගණකාධිකාරී (ආදායම්) හමුවී අදාළ තොරතුරු ලබාගන්නා මෙන් දන්වමි.

02. 2016.06.30 දිනට තිබෙන හිඟ ශේෂයට අදාළ එදින දක්වා කරන ලද ගෙවීම් සියල්ල අඩු කරනු ඇත. ඊට අදාළ සටහන් නොවූ ගෙවීම් තිබේනම් අදාළ ගණකාධිකාරී හමුවී නිරවුල් කර ගත හැක.

03. හිඟ ශේෂය දක්වන දේපළවලට වරිපනම් ලිහිල් කිරීම, අඩු/වැඩි කිරීම් සියල්ල ගලපා 2016.06.30 දිනට ශේෂය ගෙන ඇත. එහෙත් මෙම ගැලපීම පිළිබඳව ඔබ එකඟ නොවන්නේ නම් අදාළ තහවුරු කිරීමේ ලිපි රැගෙන ගණකාධිකාරී (ආදායම්) හමු වී නිරවුල් කර ගත හැක.

ධම්මික මුතුගල,
නාගරික කොමසාරිස්.

### උපලේඛනය

| *කොට්ඨාස අංකය* | *කොට්ඨාසය* | *දේපළ විස්තරය* | *වෙන්දේසි දිනය* | *වේලාව* |
|---|---|---|---|---|
| 01 | දුටු ගැමුණු වීදිය | 22, දුටු ගැමුණු වීදිය | 2016.09.20 | පෙ.ව. 10.00 |
| 01 | දුටු ගැමුණු වීදිය | 41A1 ශ්‍රී සරණංකර පාර | 2016.09.20 | පෙ.ව. 10.30 |
| 02 | දුටු ගැමුණු වීදිය | 164 දුටු ගැමුණු වීදිය | 2016.0920 | පෙ.ව. 11.00 |
| 02 | දුටු ගැමුණු වීදිය | 190 1/1 දුටු ගැමුණු වීදිය | 2016.09.20 | පෙ.ව. 11.30 |
| 02 | දුටු ගැමුණු වීදිය | 190 2/1 දුටු ගැමුණු වීදිය | 2016.09.20 | ප.ව. 12.00 |
| 02 | දුටු ගැමුණු වීදිය | 12A රේමන් පාර | 2016.09.21 | ප.ව. 12.30 |
| 02 | දුටු ගැමුණු වීදිය | 165 2/1 එස්. ද එස්. ජයසිංහ මාවත | 2016.09.21 | පෙ.ව. 10.00 |
| 02 | දුටු ගැමුණු වීදිය | 19B සිරිගල් මාවත | 2016.09.21 | පෙ.ව. 10.30 |
| 03 | කොහුවල | 106A එස්. ද එස්. ජයසිංහ මාවත | 2016.09.21 | පෙ.ව. 11.00 |
| 03 | කොහුවල | 207 A 2/1 හයිලෙවල් පාර | 2016.09.21 | පෙ.ව. 11.30 |
| 03 | කොහුවල | 160 C 1/1 හයිලෙවල් පාර | 2016.09.21 | ප.ව. 12.00 |
| 03 | කොහුවල | 75/7 සුනේත්‍රාදේවී පාර | 2016.09.22 | පෙ.ව. 10.00 |
| 03 | කොහුවල | 09 4/1 සුනේත්‍රාදේවී පාර | 2016.09.22 | පෙ.ව. 10.30 |
| 03 | කොහුවල | 59 3/1 සුනේත්‍රාදේවී පාර | 2016.09.22 | පෙ.ව. 11.00 |
| 04 | කලුබෝවිල | 248 1/1 රෝහල පාර | 2016.09.22 | පෙ.ව. 11.30 |
| 04 | කලුබෝවිල | 42 1/1 එස්.ද එස්. ජයසිංහ මාවත | 2016.09.22 | ප.ව. 12.00 |
| 04 | කලුබෝවිල | 42 3/1 එස්.ද එස්. ජයසිංහ මාවත | 2016.09.23 | පෙ.ව. 10.00 |
| 04 | කලුබෝවිල | 42 A එස්.ද එස්. ජයසිංහ මාවත | 2016.09.23 | පෙ.ව. 10.30 |
| 04 | කලුබෝවිල | 46 A 1/1 එස්.ද එස්. ජයසිංහ මාවත | 2016.09.23 | පෙ.ව. 11.00 |
| 04 | කලුබෝවිල | 312 3/1 රෝහල පාර | 2016.09.23 | පෙ.ව. 11.30 |
| 04 | කලුබෝවිල | 336 1/1 රෝහල පාර | 2016.09.23 | ප.ව. 12.00 |
| 04 | කලුබෝවිල | 336 2/2 රෝහල පාර | 2016.09.24 | පෙ.ව.10.00 |
| 04 | කලුබෝවිල | 336 1/5 රෝහල පාර | 2016.09.24 | පෙ.ව. 10.30 |
| 04 | කලුබෝවිල | 14/1 එස්.ද එස්. ජයසිංහ මාවත | 2016.09.24 | පෙ.ව. 11.00 |
| 04 | කලුබෝවිල | 36 B 1/1 එස්.ද එස්. ජයසිංහ මාවත | 2016.09.24 | පෙ.ව. 11.30 |

| කොට්ඨාස අංකය | කොට්ඨාසය | දේපළ විස්තරය | වෙන්දේසි දිනය | වේලාව |
|---|---|---|---|---|
| 04 | කලුබෝවිල | 44 එස්.ද.එස් ජයසිංහ මාවත | 2016.09.24 | ප.ව. 12.00 |
| 04 | කලුබෝවිල | 46 එස්.ද.එස් ජයසිංහ මාවත | 2016.09.24 | ප.ව. 12.30 |
| 07 | ගල්වල | 07 රෝහල පාර | 2016.09.24 | ප.ව. 1.00 |
| 07 | ගල්වල | 04 A රෝහල පාර | 2016.09.24 | ප.ව. 1.30 |
| 04 | කලුබෝවිල | 19 A ටෙම්පල් පාර | 2016.09.26 | පෙ.ව. 10.00 |
| 05 | හත්බෝධිය | 41/6 ඇල ඉවුර පාර | 2016.09.26 | පෙ.ව. 10.30 |
| 05 | හත්බෝධිය | 104 රෝහල පාර | 2016.09.26 | පෙ.ව. 11.00 |
| 06 | සරණංකර | 24 ක්‍රීඩා මාවත | 2016.09.25 | පෙ.ව. 11.30 |
| 07 | ගල්වල | 35 අනගාරික ධර්මපාල මාවත | 2016.09.27 | පෙ.ව. 10.00 |
| 07 | ගල්වල | 07 A දෙහිවල පාර | 2016.09.27 | පෙ.ව. 10.30 |
| 07 | ගල්වල | 17 නගර සභා පටුමග | 2016.09.27 | පෙ.ව. 11.00 |
| 07 | ගල්වල | 10 නගර සභා පටුමග | 2016.09.27 | පෙ.ව. 11.30 |
| 08 | දෙහිවල බටහිර | 42 A දෙහිවල පාර | 2016.09.27 | ප.ව. 12.00 |
| 08 | දෙහිවල බටහිර | 42 1/1 දෙහිවල පාර | 2016.09.27 | ප.ව. 12.30 |
| 08 | දෙහිවල බටහිර | 138/5 දෙහිවල පාර | 2016.09.27 | ප.ව. 1.00 |
| 08 | දෙහිවල බටහිර | 37 කැම්බල් පෙදෙස | 2016.09.28 | පෙ.ව. 10.00 |
| 08 | දෙහිවල බටහිර | 02 ද අල්විස් පෙදෙස | 2016.09.28 | පෙ.ව. 10.30 |
| 08 | දෙහිවල බටහිර | 02 රත්නාකර පෙදෙස | 2016.09.28 | පෙ.ව. 11.00 |
| 08 | දෙහිවල බටහිර | 54 දෙහිවල පාර | 2016.09.28 | පෙ.ව. 11.30 |
| 08 | දෙහිවල බටහිර | 54 1/1 දෙහිවල පාර | 2016.09.28 | ප.ව. 12.00 |
| 08 | දෙහිවල බටහිර | 39 වාසල පාර | 2016.09.28 | ප.ව. 12.30 |
| 08 | දෙහිවල බටහිර | 07 A ප්‍රේසර් ඇවනිවු | 2016.09.28 | ප.ව. 1.00 |
| 09 | දෙහිවල-නැගෙනහිර | 113 A අනගාරික ධර්මපාල මාවත | 2016.09.29 | පෙ.ව. 10.00 |
| 10 | උද්‍යාන | 79/9B ප්‍රතිබිම්බාරාම පාර | 2016.09.29 | පෙ.ව. 10.30 |
| 10 | උද්‍යාන | 27 A ග්‍රීන්ලන්ඩ් ඇවනිවු | 2016.09.29 | පෙ.ව. 11.00 |
| 10 | උද්‍යාන | 287 හිල් වීදිය | 2016.09.29 | පෙ.ව. 11.30 |
| 13 | ජයතිලක | 243/1 දෙහිවල පාර | 2016.09.30 | පෙ.ව. 10.00 |
| 13 | ජයතිලක | 245/1 දෙහිවල පාර | 2016.09.30 | පෙ.ව. 10.30 |
| 13 | ජයතිලක | 12 මේජර් එල්.වී.ගුණරත්න මාවත | 2016.09.30 | පෙ.ව. 11.00 |
| 13 | ජයතිලක | 12 2/1 මේජර් එල්.වී.ගුණරත්න මාවත | 2016.09.30 | පෙ.ව. 11.30 |
| 13 | ජයතිලක | 12 1/1 මේජර් එල්.වී.ගුණරත්න මාවත | 2016.09.30 | ප.ව. 12.00 |
| 13 | ජයතිලක | 16 මේජර් එල්.වී.ගුණරත්න මාවත | 2016.09.30 | ප.ව. 12.30 |
| 13 | ජයතිලක | 69 A 1/1 ගල්කිස්ස පාර | 2016.09.30 | ප.ව. 1.00 |
| 13 | ජයතිලක | 69 2/1 ගල්කිස්ස පාර | 2016.09.30 | ප.ව. 1.30 |
| 13 | ජයතිලක | 77A ගල්කිස්ස පාර | 2016.09.31 | පෙ.ව. 10.00 |
| 13 | ජයතිලක | 22 2/1 ගල්කිස්ස පාර | 2016.09.31 | පෙ.ව. 10.30 |
| 13 | ජයතිලක | 22 3/1 ගල්කිස්ස පාර | 2016.09.31 | පෙ.ව. 11.00 |
| 13 | ජයතිලක | 22 LG 2 ගල්කිස්ස පාර | 2016.09.31 | පෙ.ව. 11.30 |
| 13 | ජයතිලක | 32/1 ගල්කිස්ස පාර | 2016.09.31 | ප.ව. 12.00 |
| 13 | ජයතිලක | 32/1 1/1 ගල්කිස්ස පාර | 2016.09.31 | ප.ව. 12.30 |
| 13 | ජයතිලක | 07 D.B ජයතිලක මාවත | 2016.09.31 | ප.ව 01.00 |
| 13 | ජයතිලක | 18 B ජයතිලක මාවත | 2016.09.31 | ප.ව. 01.30 |
| 13 | ජයතිලක | 46 A 1/1 ජයතිලක මාවත | 2016.10.03 | පෙ.ව. 10.00 |
| 13 | ජයතිලක | 46 A 1 ජයතිලක මාවත | 2016.10.03 | පෙ.ව. 10.30 |
| 13 | ජයතිලක | 178 දෙහිවල පාර | 2016.10.03 | පෙ.ව. 11.00 |
| 13 | ජයතිලක | 41 A මේජර් එල්.වී.ගුණරත්න මාවත | 2016.10.03 | පෙ.ව. 11.30 |
| 13 | ජයතිලක | 55 ගල්කිස්ස පාර | 2016.10.03 | ප.ව. 12.00 |
| 13 | ජයතිලක | 10 ගල්කිස්ස පාර | 2016.10.03 | ප.ව. 12.30 |
| 13 | ජයතිලක | 83 A ගල්කිස්ස පාර | 2016.10.03 | ප.ව. 01.00 |
| 15 | කවුඩාන නැගෙනහිර | 65/42 කව්ඩාන අත්තිඩිය පාර | 2016.10.04 | පෙ.ව. 10.00 |
| 15 | කවුඩාන නැගෙනහිර | 65 A කව්ඩාන අත්තිඩිය | 2016.10.04 | පෙ.ව. 10.30 |

| කොට්ඨාස අංකය | කොට්ඨාසය | දේපළ විස්තරය | වෙන්දේසි දිනය | වේලාව |
|---|---|---|---|---|
| 15 | කවුඩාන නැගෙනහිර | 95 A නිකපේ පාර | 2016.10.04 | පෙ.ව. 11.00 |
| 15 | කවුඩාන නැගෙනහිර | 02 විජිත පාර | 2016.10.04 | පෙ.ව. 11.30 |
| 16 | කවුඩාන බටහිර | 207 ගල්කිස්ස පාර | 2016.10.05 | පෙ.ව. 10.00 |
| 16 | කවුඩාන බටහිර | 207 A ගල්කිස්ස පාර | 2016.10.05 | පෙ.ව. 10.30 |
| 16 | කවුඩාන බටහිර | 144 A කව්ඩාන පාර | 2016.10.05 | පෙ.ව. 11.00 |
| 16 | කවුඩාන බටහිර | 179 ගල්කිස්ස පාර | 2016.10.05 | පෙ.ව. 11.30 |
| 16 | කවුඩාන බටහිර | 191 A ගල්කිස්ස පාර | 2016.10.05 | ප.ව. 12.00 |
| 16 | කවුඩාන බටහිර | 215 1/1 ගල්කිස්ස පාර | 2016.10.05 | ප.ව. 12.30 |
| 16 | කවුඩාන බටහිර | 41A 1/1 සමගි මාවත | 2016.10.05 | ප.ව. 01.00 |
| 17 | ගල්කිස්ස | 170 ගල්කිස්ස පාර | 2016.10.06 | පෙ.ව. 10.00 |
| 17 | ගල්කිස්ස | 182 A ගල්කිස්ස පාර | 2016.10.06 | පෙ.ව. 10.30 |
| 18 | විද්‍යාල | 27 1/1 ද සේරම් පාර | 2016.10.06 | පෙ.ව. 11.00 |
| 18 | විද්‍යාල | 12 කොලේජ් ඇවයුනි | 2016.10.06 | පෙ.ව. 11.30 |
| 18 | විද්‍යාල | 16 කොලේජ් ඇවයුනි | 2016.10.06 | ප.ව. 12.00 |
| 18 | විද්‍යාල | 240 ගල්කිස්ස පාර | 2016.10.07 | පෙ.ව. 10.00 |
| 18 | විද්‍යාල | 240 1/1 ගල්කිස්ස පාර | 2016.10.07 | පෙ.ව. 10.30 |
| 18 | විද්‍යාල | 360 1/17 ගල්කිස්ස පාර | 2016.10.07 | පෙ.ව. 11.00 |
| 18 | විද්‍යාල | 360/5 ගල්කිස්ස පාර | 2016.10.07 | පෙ.ව. 11.30 |
| 18 | විද්‍යාල | 43/2C බීච් රෝඩ් (වෙරළ පාර) | 2016.10.07 | ප.ව. 12.00 |
| 18 | විද්‍යාල | 34/7A ද සෙරම් පාර | 2016.10.08 | පෙ.ව. 10.00 |
| 18 | විද්‍යාල | 56/3 ද සෙරම් පාර | 2016.10.08 | පෙ.ව. 10.30 |
| 18 | විද්‍යාල | 60 A ද සෙරම් පාර | 2016.10.08 | පෙ.ව. 11.00 |
| 18 | විද්‍යාල | 32 දුම්රියපළ පාර | 2016.10.08 | පෙ.ව. 11.30 |
| 19 | වටරප්පල පාර | 295 1/2 ගල්කිස්ස පාර | 2016.10.08 | ප.ව. 12.00 |
| 19 | වටරප්පල පාර | 295 2/1 ගල්කිස්ස පාර | 2016.10.08 | ප.ව. 12.30 |
| 19 | වටරප්පල පාර | 275 1/1 ගල්කිස්ස පාර | 2016.10.08 | ප.ව. 01.00 |
| 19 | වටරප්පල පාර | 82 3/1 ශ්‍රී ධර්මානන්ද මාවත | 2016.10.09 | පෙ.ව. 10.00 |
| 20 | කටුකුරුඳු වත්ත | 43 B කටුකුරුඳු වත්ත පාර | 2016.10.09 | පෙ.ව. 10.30 |
| 20 | කටුකුරුඳු වත්ත | 43 C කටුකුරුඳු වත්ත පාර | 2016.10.09 | පෙ.ව. 11.00 |
| 20 | කටුකුරුඳු වත්ත | 140/7 අත්තිඩිය පාර | 2016.10.09 | පෙ.ව. 11.30 |
| 20 | කටුකුරුඳු වත්ත | 140/7A අත්තිඩිය පාර | 2016.10.09 | ප.ව. 12.00 |
| 20 | කටුකුරුඳු වත්ත | 142 1/1 අත්තිඩිය පාර | 2016.10.09 | ප.ව. 12.30 |
| 20 | කටුකුරුඳු වත්ත | 142 2/1 අත්තිඩිය පාර | 2016.10.09 | ප.ව. 01.00 |
| 21 | අත්තිඩිය උතුර | 226 අත්තිඩිය පාර | 2016.10.10 | පෙ.ව. 10.00 |
| 21 | අත්තිඩිය උතුර | 268 අත්තිඩිය පාර | 2016.10.10 | පෙ.ව. 10.30 |
| 21 | අත්තිඩිය උතුර | 05 උපනන්ද මාවත | 2016.10.10 | පෙ.ව. 11.00 |
| 21 | අත්තිඩිය උතුර | 183/2 අත්තිඩිය පාර | 2016.10.10 | පෙ.ව. 11.30 |
| 21 | අත්තිඩිය උතුර | 01 උපනන්ද මාවත | 2016.10.10 | ප.ව. 12.00 |
| 22 | වතුමුල්ල | 607 ගල්කිස්ස පාර | 2016.10.13 | පෙ.ව. 10.00 |
| 22 | වතුමුල්ල | 49 C ටෙම්පල්ස් පාර | 2016.10.13 | පෙ.ව. 10.30 |
| 23 | වෙඩිකන්ද | 45 ශාන්ත මරියා පාර | 2016.10.13 | පෙ.ව. 11.00 |
| 24 | පිරිවෙන | 66 පිරිවෙන පාර | 2016.10.13 | පෙ.ව. 11.30 |
| 24 | පිරිවෙන | 68 පිරිවෙන පාර | 2016.10.13 | ප.ව. 12.00 |
| 24 | පිරිවෙන | 369 3/2 රත්මලාන පාර | 2016.10.14 | පෙ.ව. 10.00 |
| 24 | පිරිවෙන | 147/3 රත්මලාන පාර | 2016.10.14 | පෙ.ව. 10.30 |
| 24 | පිරිවෙන | 151 රත්මලාන පාර | 2016.10.14 | පෙ.ව. 11.00 |
| 25 | අත්තිඩිය දකුණ | 32/1 සෙත්සිරි මාවත | 2016.10.14 | පෙ.ව. 11.30 |
| 25 | අත්තිඩිය දකුණ | 01 කටුකුරුඳුවත්ත දෙවන පටුමග | 2016.10.14 | ප.ව. 12.00 |
| 25 | අත්තිඩිය දකුණ | 415 රත්මලාන පාර | 2016.10.14 | ප.ව. 12.30 |
| 26 | විහාර | 56 A දෙල්ගහවත්ත පාර | 2016.10.15 | පෙ.ව. 10.00 |
| 26 | විහාර | 334 රත්මලාන පාර | 2016.10.15 | පෙ.ව. 10.30 |

| කොට්ඨාස අංකය | කොට්ඨාසය | දේපළ විස්තරය | වෙන්දේසි දිනය | වේලාව |
|---|---|---|---|---|
| 26 | විහාර | 86/1 රජ මාවත | 2016.10.15 | පෙ.ව. 11.00 |
| 26 | විහාර | 304 A රත්මලාන පාර | 2016.10.15 | පෙ.ව. 11.30 |
| 26 | විහාර | 326 රත්මලාන පාර | 2016.10.15 | ප.ව. 12.00 |
| 26 | විහාර | 378 රත්මලාන පාර | 2016.10.15 | ප.ව. 12.30 |
| 26 | විහාර | 272 රත්මලාන පාර | 2016.10.15 | ප.ව. 01.00 |
| 28 | රත්මලාන- බටහිර | 540 රත්මලාන පාර | 2016.10.17 | පෙ.ව. 10.00 |
| 29 | කඳවල | 06 තුන්වන හරස් පටුමග හින්දු විද්‍යාල චතුරශ්‍රය | 2016.10.17 | පෙ.ව. 10.30 |
| 29 | කඳවල | 05 පරණ ගුවන් තොටුපල පාර | 2016.10.17 | පෙ.ව. 11.00 |
| 29 | කඳවල | 05/2 පරණ ගුවන් තොටුපල පාර | 2016.10.17 | පෙ.ව. 11.30 |
| 29 | කඳවල | 05/3 පරණ ගුවන් තොටුපල පාර | 2016.10.17 | ප.ව 12.00 |
| 29 | කඳවල | 18 පස්වන පටුමග රත්මලාන | 2016.10.17 | ප.ව. 12.30 |
| 29 | කඳවල | 51 වල්ලි අම්මාරව්ච් පාර ඔබ්බෙහි | 2016.10.17 | ප.ව. 01.00 |
| 29 | කඳවල | 10 13 වන පටුමග රත්මලාන | 2016.10.19 | පෙ.ව. 10.00 |
| 29 | කඳවල | 11/4 පරණ ගුවන්තොටුපළ පාර | 2016.10.19 | පෙ.ව. 10.30 |
| 29 | කඳවල | 11/7 පරණ ගුවන්තොටුපළ පාර | 2016.10.19 | පෙ.ව. 11.00 |
| 29 | කඳවල | 509 රත්මලාන පාර | 2016.10.19 | පෙ.ව. 11.30 |
| 29 | කඳවල | 53 වල්ලි අම්මාරව්ච් පාර ඔබ්බෙහි | 2016.10.19 | ප.ව. 12.00 |

08-310

---

## මහරගම නගර සභාව

### නගර සභා ආඥාපනත යටතේ (255 වන අධිකාරය) 50 හා 52 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥා පනතේ 255 වන අධිකාරයේ 50 හා 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ,මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උප ලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහසභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උප ලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ලේකම් හා සභාවේ බලතල,
කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි.

2016 ජූලි මස 25 වැනි දින,
මහරගම නගර සභාවේ දී ය.

| අනු අංකය | සැලසුම් අංකය හා දිනය | මාර්ගයේ නම | මාර්ගයේ දිග | මාර්ගයේ පළල | උපලේඛනය අනුව සීමාවන් |
|---|---|---|---|---|---|
| 01 | සැ.අ :- 902/3<br>දිනය :- 1988.02.15 | තලවතුගොඩ වැලි පාර ව.අ 174/36 සිට 174/40 දක්වා අතුරු මාර්ගය | අඩි 329 | අඩි 15 | උතුරට :- අඩි 15 අතුරු මාර්ගය<br>දකුණට :- කැබලි අංක 5 ඉඩම<br>නැගෙනහිරට :-<br>බටහිරට :-කැබලි අංක 1,2.3,4 යන ඉඩම් |

08-243

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.